# එසේ නම් කිලිනොච්චියෙන් පසු ? - කුසල් පෙරේරා

අද කිලිනොච්චිය යන වදන, 2005 දී සුනාමි යන වදනට සමානව හෝ ඊටත් වැඩි ජනප්‍රියත්වයක් ප්‍රසිද්ධියක් ලැබූවකි. කිලිනොච්චිය සතු වැදගත්කම කුමක් ද ? වසර තුනකට ආසන්න කාලයක් සටන් විරාම ගිවිසුම ගැන සාකච්ඡා කිරීමට සියලු විදේශ නියෝජිතයින්, ඇතැම් දේශපාලන නායකයින්, දේශීය හා විදේශීය ජන මාධ්‍යවේදීන් සහ විවිධාකාර සාම ක්‍රියාධරයින් හැම විට සිනහ මුසු මුහුණින් සිටි තමිල් සෙල්වම් හමු වන්නට දුව ගියේ එහි ය. එල්.ටී.ටී.ඊ. ය ඔවුන් ගේ ඊළාම් පරිපාලන කාර්යාලය, ඊළාම් පොලිසිය, ඊළාම් උසාවිය, ඔවුන් ගේ නීති විද්‍යාලයය සහ සාම ලේකම් කාර්යාලය වැනි ප්‍රසිද්ධ මහජන ආයතන පවත්වා ගත්තේ ද එහි ය. එල්.ටී.ටී.ඊ. පාලනයට නතුව ඇති වන්නියේ ජනතාවට කිලිනොච්චිය වැදගත් වූයේ ශ්‍රී ලංකාවේ අපට, කොළඹ සහ ජයවර්ධනපුර එක්ව ගත් කළ ඇති වැදගත්කම සේ ය. කිලිනොච්චිය ජාත්‍යන්තර ප්‍රජාවට පමණක් නොව, දකුණේ සිංහල සමාජයට ද ඉදිරිපත් වූයේ එල්.ටී.ටී.ඊ. යේ බල මධ්‍යස්ථානය ලෙසිනි.

ප්‍රභාකරන් හමුව සාකච්ඡා කරන්නට තමන් කිලිනොච්චි යන්නට ද සූදානම් යැයි 2005 ජනාධිපතිවරණයට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂක ලෙස ඉදිරිපත් වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ පැවසුවේ එබැවින් ය. අද හමුදා මෙහෙයුම් සමස්ථයම කිලිනොච්චි කේන්ද්‍ර කොට ගෙන ඇත්තේ ද එබැවින් ය. මෙවර දෙවන වරට කිලිනොච්චිය නැවත අල්ලා ගැනීම බෙදුම්වාදී යුද්ධයේත් එල්.ටී.ටී.ඊ. යේත් අවසානය ලෙස ඉස්මතු කර ඇත්තේ ද එබැවින් ය. ඒ අනුව වන්නිය නිදහස් කර ගැනීමේ පොරොන්දුව දකුණේ සිංහල සමාජයට ලබා දී ඇත. කිලිනොච්චියෙන් පසු කුමක් ද ? යන ප්‍රශ්නය මතු වන්නේ ද එනිසා ය.

කිලිනොච්චිය බිඳ වැටීමේ නැති නම් අල්ලා ගැනීමේ අවසන් දිනය තීන්දු කිරීම ඊට සම්බන්ධ හමුදා පාර්ශවයන්ට බාර දී මෙවර කිලිනොච්චිය අල්ලා ගැනීම පෙර මෙන් තාවකාලික නොවේය යන පූර්ව නිගමනය මත, පශ්චාත් හමුදා ජයග්‍රහණයක් ගැන සාකච්ඡා කිරීම වැදගත් වන්නකි. එවැනි හමුදා ජයග්‍රහණයක් වෙනුවෙන් මෙරට ජනතාව ඉතා වේදනාකාරී මිලක් ගෙවිය යුතු බව නිසැක ය. එය මෙතෙක් වසර 25 ට ආසන්න කාලයක් ගෙවූ යුධ මිලට අමතරව ගෙවන්නට සිදුවන්නකි. මිනිස් ජීවිත හා දේපළ විනාශ, යටිතල පහසුකම් හා පරිසර විනාශ, සියල්ල එකට ගත් විට ගෙවිය යුතු ඒ මිළ, ඇස්තමේන්තු කිරීමට ද අසීරු මිලකි. එහෙත්

සිංහල හා දෙමළ ජනතාවට මෙවර පවසා ඇත්තේ ලබා ගත හැකි ජයග්‍රහණය වෙනුවෙන් එය වටිනා මිලක් යනුවෙනි.

එවැනි අතිශය විශාල මිලක් ගෙවා ලබා ගන්නා හමුදා ජයග්‍රහණයේ ප්‍රතිලාභ ලෙස ජනතාවට ලැබෙන්නේ මොනවා ද ? එය ඉතා කලාතුරකින් ඇසෙන හා ඊටත් වඩා කලාතුරකින් පිළිතුරු සැපයෙන ප්‍රශ්නයකි. ඇත්තෙන් ම අනාගතය ගැන සාධනීය ලෙස කතා කිරීමට තරම් දෙයක් දැනට දිස් වන්නේ නැත. පළමුව මතුවන, යුද්ධයෙන් හෙම්බත්ව පැමිණෙන අතිශය විශාල සෙබළුන් සංඛ්‍යාවක් නැවත සාමාන්‍ය පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අභියෝගය ගැන, තවමත් කිසිදු කතා බහක් අසන්නට නැත. ඔවුන්ට මේ සමාජයේ රැකියාවක් කරමින් සාමාන්‍ය, වැදගත් ජීවිතයක් ගත කිරීමේ අවස්ථා නිර්මාණය කිරීම සංකීර්ණ, සංවර්ධන සැළසුමක සංවේදී පංගුවකි. අද තවමත් නැගෙන යුද ඝෝෂා මැද එවැනි උත්සාහයක, සැළසුමක හීන් හඬක්වත් ඇසෙන්නේ නැත. එනිසා රටට ඒ ඔස්සේ ඉතිරි විය හැක්කේ අඛ්බාගාත අනාගතයක් පමණි.

ඊළඟට මතුවන ඉතා වැදගත් මානුෂික කාරණය වනුයේ වවුනියාවේ සිට පේදුරු තුඩුව දක්වා උතුරුකරයම පුනරුත්ථාපනය කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයි. ලක්ෂ 03 ටත් වැඩි අතරමං වූ ජනතාවකට ඔවුන් ගේ ගම් බිම් වෙත ගොස් නැවත සාමකාමී ජීවිතයක් ආරම්භ කිරීමේ අවකාශය යුද්ධය නිමා වන්නේ නම්, නොපමාව ලබා දිය යුතු වන්නේ ය. අධි ආරක්ෂිත කලාපයන්ගෙන් තොර සාමකාමී පරිසරයක ඔවුන්ට ඔවුන් ගේ ජීවිත ගත කිරීමේ අයිතිය නැවත ලබා දිය යුතුව ඇත. ඒ වෙනුවෙන් එම ප්‍රදේශ සඳහා කඩිනම් සංවර්ධන ව්‍යාපෘති සැළසුම් කිරීම සැබෑ අභියෝගයකි. ඇත්ත අභියෝගය වන්නේ මුදල් නොව, සංවර්ධන ව්‍යාපෘතීන් හි අන්තර්ගතය හරයාත්මකව සකසා ගැනීම ය. ජාතිය ගොඩ නැගීමේ ඇමතිවරයෙකුට විරුද්ධව රුපියල් දස ලක්ෂ 4,500 ක් වටිනා වත්කම් අයථා ලෙස එකතු කර ගත්තේ යැයි චෝදනා ඉදිරිපත්ව ඇති බවත් මේ අතර සිහිපත් කර ගැනීම, ප්‍රයෝජනවත් විය හැක.

ඒවා එසේ තිබිය දී මැතිවරණ පැවැත්වීමට දෙනු ලබන පොරොන්දු මේ දැවැන්ත අභියෝගය සඳහා කිසිදු උපකාරයක් නොවනු ඇත. තම ප්‍රදේශ සංවර්ධනය කර ගැනීමට අදාල බලය ලබා දීමකින් තොරව යුද්ධය නිමා කර මැතිවරණ පැවැත්වීමේ බේදවාචකය, නැගෙනහිර ජනතාව දැන් මුහුණ දෙන තත්ත්වය විසින් පැහැදිලි කරන්නකි. අද ගැටුමකින්,

ඝාතනයකින්, ක්ලේමෝ ප්‍රහාරයකින් තොර දිනයක් නැගෙනහිරින් වාර්තා වන්නේ නැත. අද මුස්ලිම් සන්නද්ධ ක්‍රියාකාරකම් ගැන ද නැගෙනහිරින් අසන්නට ලැබෙන්නේ ය. එවැනි අස්ථාවර කිරීම් දැන් දිනෙන් දින වර්ධනය වන ප්‍රවණතාවයකි. විශාල ප්‍රචාරයක් සමඟින් එළි පෙහෙළි කළ නැගෙනහිර පළාතේ, ජීවිත පරිත්‍යාගයෙන් වෙසෙන අසරණ ජනතාව තව දුරටත් හමුදා ක්‍රියාකාරිත්වය මත නඩත්තු කෙරෙන ඉරි තැලුනු සමාජයක රඳවා ගෙන සිටීම කෙතරම් සාධාරණ ද ?

එල්.ටී.ටී.ඊ. ය සහමුලින් සමූලඝාතනය කරන බවට දෙන ලද පොරොන්දු හමුවේ, උතුර, වත්මන් නැගෙනහිරෙහි තවත් කොපියක් නොවිය යුතු ය. නැගෙනහිර මෙන් යළි අවගමනයකට නැතිනම් ඔද්දල් විමකට ඉඩ නොතැබිමට නම්, උතුර සඳහා දුර දිග යන බලය බෙදීමක් අවශ්‍ය වන්නේ ය. හමුදා භාෂාවෙන් හැඳින්වෙන ඉතිරි වන අල්ප ගෙරිල්ලා ක්‍රියාකාරකම් නැවත වර්ධනය වන්නට ඉඩ නොතබා ප්‍රධාන දේශපාලන ධාරාව තුල සම්මත දෙමළ දේශපාලනය රඳවා ගැනීමට නම්, 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබා දෙන බලයට වැඩි බලයක් උතුරට ලබා දිය යුතු ය. එහෙත් ඒ සඳහා යුද්ධය වෙනුවෙන් සමාජගත කරන්නා වූ සිංහල බෞද්ධ මතවාදයෙන් සහමුලින් වෙනස් වූ නව මතවාදයක් තෝරා ගත යුතුව ඇත.

රාජපක්ෂ පාලනය තම කරෙහි දමා ගෙන ඇති උරචක්‍ර මාලය එය ය. මේ ආණ්ඩු පාලනය ජීවත් වන්නේ තනි ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් දෙන ලද පොරොන්දුව සමගින් තහවුරු කෙරුනු මතවාදයක් සමඟින් ය. දෙමළ ජන කැමැත්තක් ඒ සඳහා නොතිබුණ ද එම ඒකීය රාජ්‍ය සරසා හැඩ කර ඉදිරිපත් කෙරුණේ සිංහල කැමැත්තට ගැලපෙන අයුරුනි. එහෙත් එල්ටීටීඊය ඊට කැමති විය. කිසිදු බලය බෙදීමකට ඉඩ නොදෙන ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් සහතික වන සිංහලවාදී ආණ්ඩුවක් කොළඹ තිබිම ඔවුන් ගේ වෙනම රාජ්‍ය සඳහා වන ඉල්ලීම සාධාරණය කිරීමට වැඩි හයියක් යැයි ඔවුහු සිතූහ.

එල්.ටී.ටී.ඊ. යේ ඒ තක්සේරුව කිරි ගසට ගැසූවාක් සේ නොවැරදුනකි. මේ ආණ්ඩුව ලවා 13 වන ව්‍යවස්ථා සංශෝධනය පූර්ණ ලෙස ක්‍රියාවට දමන්නට ඉන්දියාව ගත් ඉවසිලි සහගත උත්සාහය ද අසාර්ථක විය. සර්ව පාක්ෂික නියෝජිත සමුළුව මගින් පොරොන්දු වූ බලය බෙදීමේ යෝජනා මේ ආණ්ඩුව මගින් ඉටු කර ගැනීමට හැකියැයි ඉන්දියාව උතුරේ දෙමළ ජනතාවත් පාවා දෙමින් විශාල ආධාර මල්ලක් ද රැගෙන නැගෙනහිරට ගියේ ය. එහෙත් ඊට වෙනස්ව මේ ආණ්ඩුව රාජ්‍ය තව තවත් මධ්‍යගත කිරීමකට යොමුව ඇත. කොළඹ මහ ආණ්ඩුව විසින් නැගෙනහිර මහ

ඇමති ගේ කැමැත්ත අනුව උපදේශකයෙකු තෝරා පත් කර ගැනීමට ද ඉඩ නොතැබි ය. අලුතින් පිහිටු වනු ලැබූ සබරගමුව සහ උතුරුමැද පළාත් හි ඇමතිවරුන් පත් කළ හැකි වූයේ ද ජනාධිපති ගේ කැමැත්ත මත පමණි. පළාත් සභාවේ නායකයින්ට අවශ්‍ය තේරීමකට එහි දී ද ඉඩ නොලැබිණ.

එනමුත් නිදහස් හා සාධාරණය කෙසේ වෙතත් මේ රාජපක්ෂ පාලනය මැතිවරණ පැවැත් විමට ඉඩ ඇත. එමගින් 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු ප්‍රමාණයට හෝ බලය බෙදීමක් උතුරට නොලැබෙණු ඇත. එය සරළ තර්කයකි. මේ ආණ්ඩුව පවත්වා ගෙන යන්නේ යුද්ධය වෙනුවෙන් සහාය දෙන සමාජ දේශපාලන කණ්ඩායම් වල ශක්තියෙනි. එනිසා කිලිනොච්චියෙන් පසුව ද කිසිදු සමාජ කාණ්ඩයකට සාධනීය වෙනසක් වෙනුවෙන් අවස්ථාවන් ලබා දීමට, මේ ආණ්ඩුවට නොහැකි ය. ආණ්ඩුව සමග ඉන්නා සම්මත දෙමළ දේශපාලනය ඒ හේතුවෙන් අසහනයට පත් වුව ද වෙනසක් නොවනු ඇත. එහෙත් සංගරී ලා සහ දේවානන්ද ලා වැඩි බලයක් ඉල්ලා මේ ආණ්ඩුවට එරෙහිව යනු ඇතැයි මොහොතකට හෝ නොසිතිය යුතු ය. ඔවුන් රාජ්‍ය සමග ඇති කර ගෙන ඉන්නා සම්මුතීන් නිසාවෙන් දැන් ඔවුන්ට ඉවත් විය නොහැක. එහෙත් එවැනි දේශපාලන ඉච්ඡා භංගයන් නව වටයක ගැටුම් සඳහාත් හමුදාකරණය දිග් ගැස්සීමටත් ඉඩ ලබා දෙනු ඇත. ඒ වෙනුවෙන් මෙයත් අමතක නොකළ යුතු ය. මේ වසර අවසන් වන්නට පෙර කොටි සමූලඝාතනය කරන්නට පොරොන්දු දී ඉන්නා ආණ්ඩුව විසින් ඉදිරි මාසයෙ හි ලබන 2009 වසර සඳහා ඉදිරිපත් කෙරෙන අය වැයෙන් ආරක්ෂක වියදම ලෙස යුද්ධය සඳහා වෙන් කරන ලද මුදල තව දුරටත් වැඩි කර ඇතැයි දැනටත් වාර්තා වන්නේ ය.

එසේ නම් අතිශය දැවැන්ත වන්දියක් ගෙවා වන්නිය යළි දිනා ගැනීමෙන් සිංහල සමාජයට ලැබෙන්නා වූ සාම ප්‍රතිලාභය කුමක් ද ? මාස කිහිපයක් යුධ ජයග්‍රහණ ගැන කෙරෙන සතුටු සාමිචි සහ ජය ඝෝෂා වලට අමතරව සිංහල සමාජයට ඉතිරි වන්නේ ජනාධිපතිවරණයේ දී පොරොන්දු වූ ඒකීය රාජ්‍ය පමණි. වෙනසකට ඇත්තේ එය තිබුණාටත් වඩා මධ්‍යගත හා බාල්දු කර තිබිම පමණි. අන් හැම අර්ථයෙන් ම එය සිංහල සමාජය නිදහසෙන් පසු වසර 60 ක් ජීවත් වූ ඒකීය රාජ්‍යම වන්නේ ය. දිළිඳුකම, විරැකියාව, විදේශ ණය, සමාජ ගැටුම්, දූෂණය හා වංචාව ක්‍රමානුකූලව වැඩි වූ සහ ඒ සමගින් ගර්භිත වූ දේශපාලන සංස්කෘතිය ඉස්මත්තෙහි නිමක් නැති මානව හා මූලික අයිතිවාසිකම් උල්ලංඝණයකට ඉඩ දුන් ඒකීය රාජ්‍යයම වන්නේ ය. හෙළ උරුමයේ

න්‍යායචාර්ය සහ පරිසර ඇමති චම්පික රණවක ද පිළිගන්නා අයුරු මේ ඒකීය රාජ්‍ය අත ඇති මුදල් ටික හෝ වැය කිරීමට ශක්තියක් නොමැති අකාර්යක්‍ෂම රාජ්‍යයකි.

පච්කාර කම වනුයේ තම අනාගත සංවර්ධනය පිළිබඳ අර්බුදය විසඳා ගැනීම සඳහා වසර 60 ක් ඵලදායි කිසිවකට මග පාදා නොදුන් මේ ඒකීය රාජ්‍ය සමගින් සාධනීය ලෙස ගනු දෙනු කරන්නට සිංහල සමාජයෙහි ඉඟියක් වත් මතු නොවීම ය. බෙලහීන ප්‍රධාන විපක්ෂය ලෙස එජාපය පවත්නා තාක් කල් ස්ථාවර ඵලදායි සංවර්ධනයකට ඉඩ ලබා ගත හැකි විකල්ප විසඳුමක් ලෙස එක්සත් රටක බලය බෙදීමේ යෝජනා සාකච්ඡා කරීමේ අවස්ථාවක් හෝ සිංහල සමාජයට ලැබෙන්නේ නැත. මේ ඒකීය රාජ්‍ය නඩත්තු කිරීම හා ඵලදායි, ස්ථාවර, සමාජ ආර්ථික සංවර්ධනයක් අතර කිසිදු පෑහීමක් නොමැති බව දකුණ තේරුම් ගන්නේ ද නැත. ඒ පාඩම ඉගැන් විමට කිලිනොච්චියට හැකි නම් මෙවැනි අධික වන්දියක් එවැනි ලේ වැකි පාඩමක් වෙනුවෙන් ගෙවන්නට දකුණට සිදු විම අනිවාර්ය වුවක් ලෙස පිළිගත යුත්තකි. එය මේ බුදුන් ගේ දෙශයෙ හි දෙවියන් ගේ කැමැත්ත විය හැක.